## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර මතය

මීගමුව මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට මීගමුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාය පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව,මෙම වාර්තාවේ 1.6.2(ඌ,එ),1.6.3(අ) හා 1.6.4 යන නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ අංක 3.28 හා එහි පරිශිෂ්ඨය 2 හි පහදාදීම් හා මඟපෙන්වීම්හි EG 6.2 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී රු.289,768,000ක් ලෙස සිදු කර තිබුණු ගැලපීම් කුමක්ද යන්නට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. අතිරික්තයට ගලපා තිබුණු ආයෝජන ආදායම් රු.22,986,375ක් නැවත ගලපා නොතිබුණු අතර අතිරික්තයට ගලපා නොතිබුණු රු.1,332,215ක් අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස ගලපා තිබුණි. තව ද අතිරික්තයට එකතු කළ යුතු වර්ෂයේ ණය පොලී වියදම රු11,362,763ක් අඩුකර තිබුණි . | පිළිගෙන ඇති බව. | ප්‍රමිතියට අනුව ගැලපීම් සිදුකර ගිණුම්වල අනාවරණය කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ අංක 3.29 හා එහි පරිශිෂ්ඨය 2 හි පහදාදීම් හා මඟපෙන්වීම්හි EG 6.3 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ලැබූ පොලිය රු.22,986,375ක් වෙනුවට ගෙවූ පොලී වටිනාකම වූ රු11,362,763ක් ලැබූ පොලී ලෙස දක්වා තිබුණු අතර රු.19,777,602ක ජර්නල් සටහන් මාරු කිරීම් ද ඇතුලත්ව දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් සඳහා මුදල් යෙදවුම් ලෙස රු.33,988,649ක් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ප්‍රමිතියේ අංක 3.30 හා එහි පරිශිෂ්ඨය 2 හි පහදාදීම් හා මඟපෙන්වීම්හි EG 6.4 ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ලද ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.15,538,788ක් වුවද | පිළිගෙන ඇති බව. | ප්‍රමිතියට අනුව ගැලපීම් සිදුකර ගිණුම්වල අනාවරණය කළ |

| | | | |
|---|---|---|---|
| | රු.6,542,130ක් ලෙස දක්වා තිබුණු අතර දිගුකාලීන ණය සඳහා වූ පොලී ගෙවීම් රු11,362,763ක් දක්වා නොතිබුණි . | | යුතුය. |
| (ඇ) | 2021 පෙබරවාරි 12 දිනැති අංක LGD/10A/4/න.ගි/2019 දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ස්ථාවර වත්කම් භාණ්ඩ 14ක් යටතේ වර්ගීකරණය කළ යුතු වුවත්, දේපල පිරියත හා උපකරණවල නිවැරදි අයිතමයන් හඳුනාගෙන ගිණුම්ගත කරනු වෙනුවට රු.29,020,464ක් වෙනත් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන ලද රු.388,770,000ක් වූ මෝටර් වාහන හා රු.7,047,317ක් වූ ගොඩනැගිලි වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.176,183 ක් හා රු.15,550,800 ක් ලෙස රු. 15,726,983ක ක්ෂය වෙන්කිරීම් සිදු කර නොතිබුණි | පිළිගෙන ඇතිබව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස හඳුනාගෙන තිබූ ප්‍රාග්ධන වැය සඳහා දරන ලද රු.109,421,830ක් දේපල පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ලබන වසරේදී එම වත්කම් ප්‍රාග්ධනිත කිරීමට පියවර ගන්නා බව. | -එම- |
| (ඇ) | 2022 වර්ෂයේදී වියදම ලෙස හඳුනාගෙන තිබුණු වටිනාකමින් ප්‍රාග්ධන වැය සඳහා දරන ලද රු.26,809,691ක් දේපල පිරියත හා උපකරණ ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සභාව විසින් නිලධාරින් 9දෙනෙකුගෙන් ලබාගන්නා ලද රු.140,000ක් වූ ඇප තැන්පතු මුදල් සේවක ඇප තැන්පත් ගිණුමෙහි දැක්වීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබූ අතර, එම මුදල ආයෝජනය කිරීමක්ද සිදුකර නොතිබුණි. | ස්ථාවර තැන්පත් ගිණුම් ආරම්භ කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලිය රු.22,282,598ක් වුවත් රු.22,986,375ක් ලෙස රු.703,777ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වසරේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ සභා ප්‍රතිපාදනවලින් සිදුකරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘති 8කට අදාලව රු.9,323,789ක් වූ වටිනාකම ප්‍රාග්ධනිත නොකොට පුනරාවර්ථන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | රු.6,611,719.00 ක් පමණක් ප්‍රාග්ධන වැය වන අතර, එය 2024 නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (උ) | පෙර වර්ෂයේ වැඩ අවසන් නොවූ හා ජෙනරේටරයක් මිලදී ගැනීම වෙනුවෙන් වූ ප්‍රාග්ධන ව්‍යාපෘති 6 කට අදාල එකතුව රු.107,634,195 ක් නොනිමි ලෙස ප්‍රාග්ධනිත කරනු වෙනුවට පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ බව විගණනය විසින් ඉකුත් වර්ෂයේදී පෙන්වා දී තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී එම වරද නිවැරදි කර නොතිබුණි. | ලබන වසරේදී එම වත්කම් ප්‍රාග්ධනිත කිරීමට පියවර ගන්නා බව. | -එම- |
| (ඌ) | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නිමකර තිබුණු සම්පත් ප්‍රතිචක්‍රියකරණ මධ්‍යස්ථානයේ වැඩ වටිනාකම වූ රු.32,503,669ක් දේපල පිරියත උපකරණ යටතේ ගිණුම් ගත කර නොතිබූ බව ඉකුත් වර්ෂයේදී පෙන්වා දී තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී ද එම වරද නිවැරදි කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ උපලේඛනවල එකතු හා මූල්‍ය ප්‍රකාශවල ගිණුම් 13 ක ශේෂයන් අතර රු. 62,427,644 ක්වූ නොසැසඳුණු වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ තොගවලට අදාල උපලේඛනය, ගබඩා තොග ලේඛන අනුව සැසඳීමේදී තොග ඒකක 9,972ක වටිනාකම රු.12,533,395ක නොසැසඳීමක් පැවතුණි. | -එම- | -එම- |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ලැබියයුතු වෙනත් දඩ | 371,636 | උපලේඛන හා කාල විශ්ලේෂණ | වසර කිහිපයක සිට පැවත එන ශේෂ හඳුනාගැනීමට කටයුතු කරමින් පවතින අතර ඉදිරියේදී නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | විගණනයට සාක්ෂි සැපයීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු විදුලි ගාස්තු | 31,310 | උපලේඛන හා කාල විශ්ලේෂණ | වසර කිහිපයක සිට පැවත එන ශේෂ හඳුනාගැනීමට කටයුතු කරමින් පවතින අතර ඉදිරියේදී නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | විගණනයට සාක්ෂි සැපයීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ලැබිය යුතු පරිපාලන ගාස්තු | 39,864 | -එම- | -එම- | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ලැබිය යුතු ආයෝජන පොලී | 4,550,996 | -එම- | -එම- | -එම- |
| (ඉ) | ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක අරමුදල් | 625,384 | ශේෂ සනාථ කිරීම් ලිපිය | -එම- | -එම- |
| (ඊ) | ජාතිය ගොඩනැගීමේ බදු | 1,000 | උපලේඛන | -එම- | -එම- |
| (උ) | පාරවල් සහ පාලම් | 69,878,724 | ස්ථාවර වත්කම් ලේඛන හා උපලේඛන | පිළිතුරු ලබාදී නොමැත. | -එම- |
| (ඌ) | පිරියත හා යන්ත්‍ර | 125,352,316 | -එම- | -එම- | -එම- |
| (එ) | වෙනත් වත්කම් | 28,158,184 | -එම- | -එම- | -එම- |
| (ඒ) | නිල නිවාස කුලී | 453,242 | කාල විශ්ලේෂණ | උපලේඛණ මේ සමඟ ඉදිරිපත් කරන බව. | -එම- |
| (ඔ) | ගෙවිය යුතු අගය එකතු කළ බදු | 5,194,235 | උපලේඛන | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය | මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 24 දිනැති මහා නගර සහා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග | | | |

| | | | | |
|---|---|---|---|---|
| I | 395 | නියෝගය අනුව බදු දීම සඳහා ලිත් වර්ෂයක් පදනම් කර ගත යුතු වුවද මස් කඩ 7 ක් වෙනුවෙන් තෝරාගත් බදු ගැනුම්කරුවන් සමඟ 2022 ජූලි 01 දින සිට 2023 ජූනි 30 දින දක්වා වූ වර්ෂයක කාලයක් සඳහා ද පසුව 2023 ජූලි 01 දින සිට 2024 ජූනි 30 දින දක්වා වූ වර්ෂයක කාලයක් සඳහා ද ගිවිසුම් ගත වී තිබුණු අතර රාජපක්ෂ උද්‍යානයේ අයිස්ක්‍රීම්හල 2022/2024 වර්ෂ සඳහා බදු දීමට අදාලව ද ලිත් වර්ෂයක් පදනම් කර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | යොමුගත රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| II | 398 හා 409 | කොච්චිකඩේ පුස්තකාල ගොඩනැගිල්ලේ බිම් මහල කඩ කාමර තක්සේරු වටිනාකම රු. 1,500,000ක් ලෙස තීරණය කිරීමට වරලත් තක්සේරුකරුවෙකුගේ තක්සේරු වාර්තාවක් පදනම් කර ගෙන නොතිබුණු අතර 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මස් කඩ 7 ක බදු දීම සම්බන්ධයෙන් එලෙස තක්සේරුවක් ලබාගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| I | මු.රෙ. 486 | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයේ සටහන 12 යටතේ දක්වා තිබුණු අගරු චෙක්පත් 52 ක් අතරින් රු.878,157 ක් වටිනාකමැති චෙක්පත් 50 ක් වර්ෂ 10 කට වඩා පැරණි ශේෂයන් වූ අතර සමාලෝචිත වර්ෂය තුලදී එම ශේෂය පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| II | මු.රෙ. 571(2) | වර්ෂ දෙක ඉක්මවූ රු.12,243,285 ඉකුත් තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| III | මු.රෙ. 880 | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කිරීම සඳහා සභාවේ දේපල තහනම් නිලධාරින් හැර ඇප තැබිය යුතු අනෙක් නිලධාරින් කවුරුන් ද යන්න හඳුනාගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/13/2016(i) දරන පළාත් පාලන චක්‍රලේඛය | ගිවිස ගත් දිනෙන් සෑම වසර 3 කට වරක් මාසික කුලිය රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත ප්‍රතිශෝධනය කළ යුතු වුවත් එෆ්. සාප්පු සංකීර්ණයේ කඩ කාමර කුලී තක්සේරුව 2017 වර්ෂයේදී ද කොච්චිකඩේ පුස්තකාල ගොඩනැගිල්ලේ බිම් මහල කඩ කාමර සඳහා වූ කුලිය 2018 වර්ෂයේදී ද අවසාන වරට ප්‍රතිශෝධනය කර තිබුණි. තවද කැල්ටන් හෝටලය අසල සාප්පු සංකීර්ණයේ කඩ කාමර බදු දීම සඳහා 2008 ඔක්තෝබර් 17 දින මීගමුව මහා නගර සභාව විසින් තීරණය කරන ලද රු. 1,680 ක සිට රු. 6,450ක් අතර පරාසයක වූ මාසික කුලියක් අයකරගෙන තිබුණි. | තක්සේරු වාර්තා ලැබුණු වහාම සංශෝධනය කිරීමට පියවර ගන්නා බව. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.204,958,275 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 12,401,464ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 167,173 | 196,520 | 167,191 | 244,198 | 166,010 | 173,466 | 150,839 | 22,627 |
| (ii) | කුලී | 88,791 | 86,355 | 86,873 | 39,103 | 96,552 | 72,777 | 71,667 | 1,110 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 15,956 | 23,997 | 24,060 | 2,299 | 16,722 | 16,861 | 16,851 | 10 |
| (iv) | වෙනත් ආදායම් | 828,788 | 824,451 | 829,386 | 15,692 | 932,912 | 739,011 | 730,397 | 8,614 |
| | | --------- | -------- | -------- | ---------- | ------------ | ----------- | --------- | ------- |
| | | 1,100,708 | 1,131,323 | 1,107,510 | 301,292 | 1,212,196 | 1,002,115 | 969,754 | 32,361 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු බිල්කළ ආදායම, ඇස්තමේන්තුගත ආදායමට වඩා පිළිවෙලින් රු.7,456,000ක් හා රු.29,347,000ක් වැඩිවී තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 5ක් හා සියයට 18ක් දක්වා සියයට 260ක වැඩිවීමක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමට වඩා බිල්කළ ආදායමේ වැඩිවීමක් විය. එහෙත් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී බිල් කළ ආදායමෙන් රැස්කළ ආදායමේ සියයට 87 සිට සියයට 85 දක්වා අඩු වීමක් සිදු වි තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | තාත්ත්වික ව ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම්වල බිල්කළ ආදායම හා රැස් කළ ආදායම ඇස්තමේන්තුගත ආදායම හා සැසඳීමේදී බිල්කළ ආදායම රු.4,337,000 කින් අඩුවීමක් ද රැස් කළ ආදායම රු.598,000කින් වැඩි වීමක් ද වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කිරීම් තාත්ත්විකව සිදු කර තිබුණු බවක් නිරීක්ෂණය නොවීය. | -එම- | -එම- |

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 267(1) වගන්තිය ප්‍රකාර මේ ආඥා පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි පෙනීයන අතුරු ව්‍යවස්ථා කලින්කල සෑදීම කළ හැකි වුවත් සහ එම ආඥා පනතේ 272 (12) වගන්තිය ප්‍රකාරව දේපල තක්සේරු කිරීම සහ වරිපනම් හා බදු එකතු කිරීම ඇතුළුව ආදායම සඳහා මහා නගර සභාවක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි වුවත් සභාව සතු කඩ කාමර බදු දීම විධිමත් කිරීම හා නියාමනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පිළියෙල කර නොතිබුණි. | කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් මිගමුව මහ නගර සභාව විසින් අතුරු ව්‍යවස්ථා සම්මත කර නොමැති වුවද 2016 වර්ෂයේ සිට පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛන හා ගරු ආණ්ඩුකාරතුමාගේ නියමයන් හා චක්‍රලේඛන උපදෙස් හා නියමයන් පරිදි ක්‍රියා කරනු ලබන බව. | ආඥා පනත ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සැකසිය යුතුය. |
| (ආ) | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණි. | බස්නාහිර පළාත් සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තියෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළව සියලු කටයුතු නීතියෙන් ලැබී ඇති බලතල අනුව සිදුකරනු ලබන බව. | අතුරු ව්‍යවස්ථා පිළියෙල කළ යුතුය. |
| (ඇ) | මහා නගර සභා ආඥා පනතේ(252 අධිකාරය) 272 (13) හා (28)(ඊ) වගන්ති අනුව රාජපක්ෂ උද්‍යානයේ ඡායාරූපගත කිරීම් ගාස්තු සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණි. | පිළිගන්නා බව. | අතුරු ව්‍යවස්ථා පිළියෙල කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 පෙබරවාරි 01 දිනැති අංක LGD/10A/4/න. ගි/2019 දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වුවද සභාව සතු දේපල පිරියත හා උපකරණවලින් ඉඩම්, කාර්යාල උපකරණ, සවිකිරීම්, පිරියත හා යන්ත්‍ර, පරිගණක, උපාංග හා මෘදුකාංග, පාරවල්, පාලම් හා බෝක්කු හා වෙනත් යටිතල පහසුකම් යන අනෙකුත් වත්කම් හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම්,ගොඩනැගිලි, පාරවල්, පාලම් හා බෝක්කු හා වෙනත් යටිතල පහසුකම්,පිරියත හා යන්ත්‍ර, පරිගණක, උපාංග හා මෘදුකාංග ඉදිරියේ දී ප්‍රත්‍යාගණනය කිරීමට නියමිත බව. | වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දේපළ පිරියත සහ උපකරණ වටිනාකම්වල වෙළඳපල අගය තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කරවා ධාරණ අගය ලෙස හඳුනාගත යුතු වෙනුවට සභාව සතු ගොඩනැගිලි 26 ක වරිපනම් අය කිරීම සඳහා ආදායම් පරීක්ෂකවරුන් විසින් ලබාදී තිබූ රු.7,047,317 ක වාර්ෂික තක්සේරු වටිනාකම ප්‍රත්‍යාගණිත වටිනාකම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | -එම- |

3.3 මෙහෙයුම් **අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෛනික වෙළඳපොලේ කඩ කාමර 116 ක් බදු දීමේදී මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳව නියෝග 411(iii) අනුව එම කඩ කාමර බදුදීමේදී මහා නගර සභාව හා බදු ගැණුම්කරු අතර විධිමත් පරිදි ගිවිසුම්ගත වීමක් සිදු වී නොතිබුණු බවත්, කඩ බදු ගැණුම්කරු හට වෙළඳාම් කිරීම සඳහා වූ අවසර පත්‍රයක් පමණක් ලබාදී තිබුණු බවත් නිරීක්ෂණය වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 112කින් හිඟ කඩ කුලී රු.4,020,758 ක් අයවිය යුතුව පැවතිණි. | 2023 ජූලි 31 ට හිඟ රු. 4,008,209 එකතු කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | එෆ්. සාප්පු සංකීර්ණ ගොඩනැගිල්ලට අදාල කඩ කාමර 69ක් බදු දීමට අදාලව කඩ කාමර 10 ක නියැදි පරීක්ෂාවේදී කඩ කාමර 06 කට අදාලව ගිවිසුම් ගත වී නොතිබුණි. තවද 2023 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 59කින් හිඟ කඩ කුලී රු.2,049,584 ක් අයවිය යුතුව පැවතිණි. | ගිවිසුම්ගත වීමට කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් වලට එළඹිය යුතු අතර හිඟ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොච්චිකඩේ පුස්තකාල ගොඩනැගිල්ලේ බිම් මහල කඩ කාමර යතුරුකාසි මත දීර්ඝකාලීන කුලී පදනමට බදු දීම සඳහා 2015 සැප්තැම්බර් 21 දින ටෙන්ඩර්කරුවන් 4 දෙනෙකු සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණු අතර ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් පසුව සභාව විසින් කරන ලද රු.3,500ක තාවකාලික තක්සේරුවක් මත 2016 ජුනි 02 දින සිට භුක්තිය ලබාදී තිබුණු අතර කඩ කාමර 03ක් සඳහා වූ රු. 108,150,700ක කඩ කුලී හිඟව පැවතිණි. | පිළිතුරු ලබාදී නොමැත. | හිඟ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/13/2016(i) දරන පළාත් පාලන චක්‍රලේඛයට පටහැනිව කීර්තිසිංහ පාර කුකුල්මස් කඩය හා කීර්තිසිංහ පාර ගවමස් කඩය 2020 වර්ෂයේදී ලබාදී තිබූ බදුකරුවන් වෙතම 2020 වර්ෂයේ බදු මුදලටම 2021 වර්ෂය සඳහා ද බදු දී තිබුණි. 2022 ජනවාරි 01 දින සිට 2022 මාර්තු 31 දින දක්වාත් නැවත 2022 ජුනි 30 දින දක්වාත් මාස 6ක් සඳහා පෙර බදුකරුවන්ටම බදු ගිවිසුමකට හෝ එළඹීමකින් තොරව ටෙන්ඩර් ක්‍රියාවලියකින් තොරව බදු දී තිබුණු අතර 2022 ජූලි 01 දින සිට 2023 ජුනි 30 දක්වා වූ වසරක කාලපරිච්ඡේදය සඳහා ගිවිසුම්ගත වී තිබුණි. තවද විස්ත්‍රීන් මාවත ගවමස් කඩය මුද්‍රා තබා අසාධු ලේඛනගත කර තිබුණු බදුකරුගෙන් 2023 දෙසැම්බර් | ප්‍රසම්පාදන කාර්යයට කාලයක් අවශ්‍ය වන බැවින් 2020 බදුකරුවන් වෙත එම මුදලටම ලබා දීමට සභාව විසින් කටයුතු කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 31 දින වන විටත් රු.105,390ක හිඟ මුදල අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | | |
| (ඉ) | රාජපක්ෂ උද්‍යානයේ අයිස්ක්‍රීම්හල 2022/2024 වර්ෂ සඳහා බදු දීමට අදාල ටෙන්ඩර් කාර්යය සඳහා ස්ථිර හෝ අවස්ථානුකූල ටෙන්ඩර් කමිටුවක් පත් කර නොතිබුණු අතර ටෙන්ඩර් කැඳවීමක් මඟින් තෝරාගත් බදුකරු වෙත 2022 ඔක්තෝබර් 28 දින අයිස්ක්‍රීම්හල විවෘත කිරීමට යතුරු භාර නොදී පැරණි බදුකරු වෙතම බදුදීමට කටයුතු කිරීම නිසා අයිස්ක්‍රීම්හල විවෘත කිරීමට මාස 08ක ප්‍රමාදයක් සිදු වී තිබුණු හෙයින් සභාවට අහිමි වී තිබුණු කුලී මුදල රු.202,404ක් විය. | නව බදුකරු, අදාල කාලය තුළ ඇප තැන්පත් ගෙවා නොමැති බැවින්, පැරණි බදුකරුහට බදුදීමට කටයුතු කර ඇති බව. | මූල්‍ය රීති ප්‍රකාරව ටෙන්ඩර් කාර්යයන් සිදු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාව සතු නිල නිවාස 16ක් පැවතිය ද ඒ සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. එම නිල නිවාස අතරින් නිල නිවාස 3ක් කඩා ඉවත් කර තිබුණු අතර නිල නිවාස 9ක් භාවිතයෙන් තොරව පැවතුණද එහෙත් ඒ සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොවීය. සමාලෝචිත වර්ෂයේදී නිල නිවාස සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය කිරීමට කටයුතු කරන බව. | භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 757(2)(ආ) අනුව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ තීරණය වී සහ ඒ 66 ආකෘතියේ සටහන් කළ යුතු අතර ඉන්පසුව දෝෂ ගැලපුම් තහවුරු කෙරෙන බඩු ලේඛන වවුචරයක් වශයෙන් ගොනුකර තැබීම සඳහා එම ආකෘතියේ පිටපතක් ඊට සම්බන්ධ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර අනෙක් පිටපත විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා පිටපත් විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්යමණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05ක පුරප්පාඩු 6ක්ද හා තනතුරු 01ක අතිරික්තයක්ද, තෘතීය මට්ටමේ තනතුරු 02ක පුරප්පාඩු 2ක්ද, ද්විතික මට්ටමේ තනතුරු 14ක පුරප්පාඩු 34ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 14ක පුරප්පාඩු 132ක් ද හා තනතුරු 01ක අතිරික්තයක්ද විය. | මුළු පුරප්පාඩු සංඛ්‍යාව 166 ක් බව. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාවට අමතරව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 අනුව ප්‍රාථමික මට්ටමේ තනතුරු 03ක් සඳහා සේවකයින් 33දෙනෙකුද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/2019 අනුව ප්‍රාථමික මට්ටමේ තනතුරක් සඳහා සේවකයින් 20දෙනෙකුද සේවයේ නියුක්ත කර තිබුණි. | නිවැරදි බව. | අනුමත කාර්ය මණ්ඩලය පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දේපල තහනම් නිලධාරින් 05දෙනෙකු තැන්පත් කර තිබූ ඇප මුදල් රු.150,000ක් සභාව විසින් ස්ථාවර තැන්පත් ගිණුම් 07ක ආයෝජනය කර තිබුණු අතර ඒ සඳහා 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා සභාවේ ජංගම ගිණුමට බැරවී තිබුණු රු.117,229ක පොලී මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. පොලී මුදල නැවත ආයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබීම නිසා ඇප තැබූ නිලධාරින්ට අදාල කාල සීමාව අවසානයේදී ලැබෙන ප්‍රතිලාභවල අඩුවීමක් සිදුවී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | තැන්පතු අදාල නිලධාරින්ට ආපසු ලබා දීමට හෝ ආදායමට ගැනීම කළ යුතුය. |
| (ඈ) | මියගිය, විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය, බැහැර ස්ථාන මාරුවී ගිය හා වෙනත් හේතු මත නිලධාරින් 47 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට උත්සව හා විශේෂ අත්තිකාරම් වශයෙන් රු.175,050ක් අයවිය යුතුව පැවතුණු අතර ඉන් නිලධාරින් 38 දෙනෙකුගෙන් අයවිය යුතු රු120,251ක ණය ශේෂය වර්ෂයකට වඩා පැරණි විය. තවද ආපදා, දේපල හා පාපැදි ණය ලබාගත් නිලධාරින් 72 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.9,054,670ක් අයවිය යුතුව පැවතුණි. ඉන් රු.4,386,846ක් නිලධාරින් 45 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂයකට වඩා පැරණි ණය ශේෂයක් විය.එහෙත් එම ණය ශේෂය අයකර ගැනීමට හෝ කපා හැරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | -එම- | ශේෂ අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කළ යුතුය. |